මධ්‍යම පළාතේ
පළාත් සභා කාර්යාලය
23 AUG 1991
PROVINCIAL COUNCIL
OFFICE
CENTRAL PROVINCE

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 676 – 1991 අගෝස්තු 16 වැනි සිකුරාදා – 1991.08.16

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (අ) වැනි කොටස–පළාත් සභා

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ප්‍රකාශන ආදිය ... | – |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන පත්කිරීම් ආදිය ... | – |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... | – |
| පළාත් සභා නිවේදන ... ... | 758 |
| පළාත් සභා විවිධ දැන්වීම් ... ... | – |
| තනතුරු – ඇබෑර්තු ... ... | – |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... | – |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... | – |
| බඩුබාහිරාදිය විකිණීම් ... ... | – |
| තොටුපල්, රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... | – |
| විවිධ දැන්වීම් ... ... | – |


සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේදී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

ගැසට් පත්‍රයේ සෑම කොටසකම පළකළ යුතු ගැසට් නිවේදන භාර ගන්නා, වේලාව, ගැසට් පත්‍රය ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව– එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙන සේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

ගැසට් පත්‍රයේ පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම ගැසට් පත්‍රය ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 1991 අගෝස්තු මස 23 වන දින පළ කෙරෙන ගැසට් පත්‍රයට යා යුතු දැන්වීම් 1991 අගෝස්තු මස 09 වැනි දින දහවල් 12ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

නෙවිල් නානායක්කාර,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1991 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 8.

757–B 075951–7,807 (91/08)
F 1-

# පළාත් සභා නිවේදන

## මධ්‍යම පළාතේ පළාත් සභාව

මතු දැක්වෙන ප්‍රඥප්තිය 1991 මාර්තු මස 26 වැනි දින පැවැති මධ්‍යම පළාත් සභාවේ සභා රැස්වීමේ දී සම්මත වූ බවත්, එයට ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය 1991 මැයි මස 31 වැනි දින ලැබී ඇති බවත්, මෙයින් නිවේදනය කරමි.

පී. ආර්. රණසිංහ,
සභා ලේකම්,
මධ්‍යම පළාත් සභාව.

1991 ජුලි මස 22 වැනි දින,
මධ්‍යම පළාත් සභාවේ සභා ලේකම් කාර්යාලය,
තැ. පෙ. 92,
පල්ලේකැලේ,
කුණ්ඩසාලේ.

## මධ්‍යම පළාතේ 1990 අංක 11 දරන කෘෂිකර්ම ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වැනි සංශෝධනයේ කියැවෙන 9 වැනි උපලේඛනයේ I වැනි ලැයිස්තුවේ අංක 9 යටතේ පවරන ලද බලතල ක්‍රියාත්මක කිරීම සඳහා මධ්‍යම පළාතේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව පිහිටුවීම සඳහා වූ ප්‍රඥප්තියකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මධ්‍යම පළාතේ, පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

ලුහුඬු නාමය.

1. මේ ප්‍රඥප්තිය මධ්‍යම පළාතේ පළාත් සභාවේ 1990 අංක 11 දරන කෘෂිකර්ම ප්‍රඥප්තිය ලෙස හැඳින්වෙන අතර, ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබූ දිනක සිට වලංගු භාවයට පත් වන්නේය.

2. මෙම ප්‍රඥප්තියේ සඳහන් කරුණු ක්‍රියාත්මක කරනු වස් කෘෂිකර්ම අධ්‍යක්ෂ, අතිරේක කෘෂිකර්ම අධ්‍යක්ෂ, නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන්, සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන් හා කලින් කලට පත් කරනු ලැබිය හැකි වෙනත් නිළධාරීන්ගෙන් හා සේවකයන්ගෙන් සමන්විත කෘෂිකර්ම දෙපාර්තමේන්තුවක් විය යුත්තේය.

අධ්‍යක්ෂවරයාගේ වගකීම.

3. (1) අධ්‍යක්ෂවරයාගේ වගකීම වන්නේ ලේකම්වරයාගේ සාමාන්‍ය විධානයට යටත්ව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ කියැවෙන නව වැනි උපලේඛනයේ I වැනි ලැයිස්තුවේ (පළාත් සභා ලැයිස්තුවේ) 9 : 1 හා 9 : 3 ඡේදයන්හි සලස්වා ඇති අන්දමට මධ්‍යම පළාතේ කෘෂිකර්ම සංවර්ධනය හා ප්‍රවර්ධනය කිරීමයි.

අමාත්‍යවරයාගේ බලතල.

(2) මෙම ප්‍රඥප්තිය හෝ මෙම ප්‍රඥප්තිය යටතේ පනවනු ලබන රෙගුලාසි යටතේ කෘෂිකර්ම අධ්‍යක්ෂ හෝ ඔහුගේ නිළධාරීන් විසින් ඔවුන්ගේ අභිමතය අනුව කරනු ලැබූ නියමයක් හෝ තීරණයක් අභියාචනයක් මත හෝ එසේ නොමැතිව නිෂ්ප්‍රභා කිරීම, වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීමේ බලය අමාත්‍යවරයා සතුවේ. අමාත්‍යවරයාගේ තීරණය අවසාන තීරණය වන අතර, එය ක්‍රියාත්මක කිරීමට අධ්‍යක්ෂ හා ඔහුගේ නිළධාරීන් ද එම තීරණය බලපාන සියළුම පුද්ගලයන් ද බැඳී සිටිත්.

### I වැනි කොටස

### උපදේශක කමිටු

පළාත් උපදේශක කමිටුව.

4. (1) පළාතේ ප්‍රධාන අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන පුද්ගලයන් හත් දෙනෙකුට නොඅඩු සංඛ්‍යාවකින් යුක්ත පළාත් කෘෂිකර්ම උපදේශක කමිටුවක් ස්ථාපනය කළ යුතුය.

(2) අමාත්‍යවරයා විසින් එකී උපදේශක කමිටුවේ සභාපති ධුරයට අමාත්‍යාංශයේ ලේකම් නම් කළ යුතුය.

(3) අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන දෙපාර්තමේන්තුවේ නිළධාරියෙක් කමිටුවේ ලේකම් වශයෙන් කටයුතු කළ යුතුය.

(4) අමාත්‍යවරයා විසින් හෝ ලේකම්වරයා විසින් යොමු කරන ලද කරුණක් හෝ කරුණු සම්බන්ධයෙන් ද, කමිටුව විසින් උපදෙස් දිය යුතු යයි අදහස් කෙරෙන කරුණු සම්බන්ධයෙන් ද, කෘෂිකර්මයට අදාළ කාර්යයන් පිළිබඳව ද අමාත්‍යවරයාට උපදෙස් දීම උපදේශක කමිටුවේ කාර්ය විය යුතුය.

(5) කමිටුවේ කාර්ය පරිපාටිය හා රැස්වීම් කැඳවීම හා පැවැත්වීම පිළිබඳ විධිවිධාන පළාත් සභාවේ අනුමැතිය ඇතිව අමාත්‍යවරයා විසින් සකස් කරනු ඇත.

(6) කමිටුවේ සාමාජිකයෙකු අමාත්‍යවරයාට ඕනෑම අවස්ථාවක එම තනතුරෙන් ඉවත් කරනු ලැබිය හැකි අතර අමාත්‍යවරයාට ලිඛිතව සිය ඉල්ලා අස්වීම භාර දීමෙන් කමිටු සාමාජිකයෙකුට සිය තනතුරෙන් ඉල්ලා අස්විය හැක.

(7) කමිටුවේ සභාපති හෝ වෙනත් සාමාජිකයෙකුගේ අයහපත් සෞඛ්‍ය තත්ත්වය නිසා හෝ, ශ්‍රී ලංකාවෙන් බැහැරවීම නිසා හෝ වෙනත් හේතුවක් නිසා හෝ තනතුරේ රාජකාරි ඉටු කිරීමට නොහැකි වන අවස්ථාවක, අමාත්‍යවරයා විසින් එම තනතුරේ රාජකාරි ආවරණය කිරීම සඳහා වෙනත් පුද්ගලයෙකු අවස්ථානුකූලව පත් කළ හැකිය.

(8) කමිටු සාමාජිකයෙකු සිය තනතුරෙන් ඉල්ලා අස් වුවහොත් හෝ තනතුර අතහැර ගියහොත් හෝ අමාත්‍යවරයා විසින් තනතුරෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ මිස පත් කළ දින සිට අවුරුදු දෙකක කාලයකට එම තනතුර දැරිය යුතුය.

ප්‍රාදේශීය උපදේශක කමිටු.

5 (1) පළාතේ යම් කොටසක කෘෂිකාර්මික කටයුතු හා ඊට අදාලව අවශ්‍ය වන කරුණු සම්බන්ධයෙන් අධ්‍යක්ෂට උපදෙස් දීම සඳහා ප්‍රාදේශීය උපදේශක කමිටු අමාත්‍යවරයා විසින් පත් කළ හැකිය.

(2) (අ) පළාත් සභාවේ ප්‍රාදේශීය ලේකම්,
(ආ) කොට්ඨාශයේ ප්‍රාදේශීය සභාපති,
(ඇ) කොට්ඨාශයේ සියළුම ගොවිජන සේවා කමිටු සභාපතිවරුන්,
(ඈ) කොට්ඨාශයේ සියළුම ගොවිජන සේවා ප්‍රාදේශීය නිළධාරීන්,
(ඉ) කොට්ඨාශයේ සියළුම කෘෂිකර්ම උපදේශකවරුන්,
(ඊ) කොට්ඨාශයේ සියළුම ග්‍රාම සේවා නිළධාරීන් යන අයගෙන් ප්‍රාදේශීය උපදේශක කමිටුව සමන්විත විය යුතුය.

(3) එකී කොට්ඨාශයේ ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය උපදේශක කමිටුවේ සභාපති විය යුතුය.

(4) ප්‍රාදේශීය උපදේශක කමිටුවේ ලේකම් ධූරයට එකී සාමාජිකයන් අතුරෙන් රජයේ දෙපාර්තමේන්තුවක හෝ අධිකාරියක නිළධාරියෙකු කමිටුවේ පළමු රැස්වීම් වාරයේ දී තෝරා ගත යුතුය.

(5) අධ්‍යක්ෂ හෝ සහකාර අධ්‍යක්ෂ විසින් ප්‍රාදේශීය උපදේශක කමිටුවක සැළකිල්ලට යොමු කරනු ලබන සියළුම කරුණු සම්බන්ධව එම උපදේශක කමිටුව නිශ්චිත කාලයක් තුළ දී නිශ්චිත ආකාරයකට කටයුතු කර අවසාන කළ යුතුය.

(6) අදාළ කොට්ඨශයේ කෘෂිකර්ම හා කෘෂිකාර්මික අවශ්‍යතා පිළිබඳව උපදෙස් දීම හා නිර්දේශ කිරීම හැර එම කොට්ඨාශයේ විධායක හෝ පරිපාලන රාජකාරි හෝ බලතල කිසිවක් ක්‍රියාත්මක කිරීමට මෙම ප්‍රඥප්තිය යටතේ පිහිටුවෙන ප්‍රාදේශීය උපදේශක කමිටුවට බලතල කිසිවක් ඇති බවට නොසැළකිය යුත්තේය.

පළාත් හා ප්‍රාදේශීය උපදේශක කමිටු-අනු කමිටු.

(6) පළාත් හා ප්‍රාදේශීය උපදේශක කමිටු විසින් අවශ්‍ය යයි සළකනු ලබන යම් නිශ්චිත කෘෂිකාර්මික කටයුත්තක් හෝ කටයුතු පිළිබඳ ක්‍රියා කිරීමට අනු කමිටු පත් කළ හැකිය. උපදේශක කමිටු විසින් නියම කරනු ලබන කාර්යයන් අදාළ කමිටුවේ සාමාන්‍ය විධානයට හා පාලනයට යටත්ව අනු කමිටු විසින් ඉටු කළ යුත්තේය.

## II වැනි කොටස

### රෙගුලාසි පැනවීමට අමාත්‍යවරයාට ඇති බලය

අමාත්‍යවරයා සතු රෙගුලාසි පැනවීමේ බලය.

7. (1) මෙම ප්‍රඥප්තියේ වගන්තීන් හා නියමයන් ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් සභාවේ අනුමැතිය ඇතිව රෙගුලාසි පැනවීම අමාත්‍යවරයා විසින් කරනු ලැබිය හැකිය.

## III වැනි කොටස

### සාමාන්‍ය

අර්ථ නිරූපනය.

8. (1) පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ ප්‍රඥප්තියෙහි,–

"පළාත් සභාව" යන්නෙන් මධ්‍යම පළාතේ පළාත් සභාව අදහස් වේ.

"ආණ්ඩුකාරවරයා" යන්නෙන් මධ්‍යම පළාතේ ආණ්ඩුකාරවරයා අදහස් වේ.

"ප්‍රධාන අමාත්‍යවරයා" යන්නෙන් මධ්‍යම පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍යවරයා අදහස් වේ.

"අමාත්‍යවරයා" යන්නෙන් පළාතේ කෘෂිකර්ම විෂය භාර අමාත්‍යවරයා අදහස් වේ.

"ලේකම්වරයා" යන්නෙන් පළාත් කෘෂිකර්ම අමාත්‍යංශයේ ලේකම්වරයා අදහස් වේ.

"ප්‍රාදේශීය ලේකම්වරු" යන්නෙන් ඒ ඒ කොට්ඨාශවල පරිපාලන ප්‍රධානියා වශයෙන් කටයුතු කිරීමට පළාත් සභාව විසින් විධිමත්ව පත් කරන ලද ප්‍රාදේශීය ලේකම්වරුන් අදහස් වේ.

"දෙපාර්තමේන්තුව" යන්නෙන් පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව අදහස් වේ.

"අධ්‍යක්ෂ" යන්නෙන් පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ හා මෙම ප්‍රඥප්තිය යටතේ අධ්‍යක්ෂවරයාගේ බලතල හා රාජකාරි ඉටු කිරීම සඳහා අධ්‍යක්ෂවරයා විසින් බලය පැවරුනු වෙනත් නිළධාරියෙකු අදහස් වේ.

"අතිරේක කෘෂිකර්ම අධ්‍යක්ෂ" යන්නෙන් අතිරේක පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ අදහස් වේ.

"නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන්" යන්නෙන් නියෝජ්‍ය පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන් අදහස් වේ.

"සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන්" යන්නෙන් කොට්ඨාශ භාර සහකාර කෘෂිකර්ම අධ්‍යක්ෂවරුන් අදහස් වේ.

"පළාත් කෘෂිකර්ම උපදේශක කමිටුව" යන්නෙන් 4 (1) වැනි ඡේදය යටතේ ස්ථාපනය කරන ලද පළාත් උපදේශක කමිටුව අදහස් වේ.

"ප්‍රාදේශීය කෘෂිකර්ම උපදේශක කමිටු" යන්නෙන් 5 (1) වැනි ඡේදය යටතේ ස්ථාපනය කරන ලද ප්‍රාදේශීය උපදේශක කමිටු අදහස් වේ.

සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

9. මේ ප්‍රඥප්තියේ සිංහල සහ දෙමළ හෝ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

08–506

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.